# රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014(IV) අනුව සිංහල භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා IVවන කාණ්ඩයේ නිලධාරින් විසින් සහභාගි විය යුතු පැය 50 ක භාෂා කුසලතා වර්ධන පාඨමාලාව සඳහා වූ විෂය නිර්දේශය

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

## හැඳින්වීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 මගින් දක්වා ඇති පරිදි සෑම රාජ්‍ය සේවකයෙකු ම තමන් රාජ්‍ය සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක ව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ලබා සිටිය යුතු ය. එසේ ම එම චක්‍රලේඛය සංශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හා එහි සංශෝධන අතර 2017.05.30 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014(IV) අනුව IV කාණ්ඩයට අයත් සිංහල භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු නිලධාරින් විසින් සහභාගි විය යුතු පැය 50 ක භාෂා කුසලතා වර්ධන පාඨමාලාව සඳහා නිර්දේශිත විෂය නිර්දේශය මෙහි ඇතුළත් වේ.

දෙවන බසක් ලෙස සිංහල භාෂාව හැදෑරීමේ දී අනිවාර්යයෙන් ම අත්පත් කර ගත යුතු දැනුම, කුසලතා හා ආකල්ප මෙම විෂය නිර්දේශයේ අන්තර්ගත වේ. දෙවන භාෂාව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද, පාඨමාලාව සංවිධානය හා එහි කාලය විෂය නිර්දේශයට ඇතුළත් කර ඇත. ඒ සඳහා දෙවන බස ඉගැන්වීම පිළිබඳ මනා පුහුණුවක් ලද උපදේශකවරයෙකුගේ සම්පත් දායකත්වය ආධුනිකයන් සඳහා අත්‍යවශ්‍ය වනු ඇත.

## අපේක්ෂිත අරමුණු

1. එදිනෙදා සරල සංවාදවල යෙදීම පිණිස ශ්‍රවණ හා කථන කුසලතා වර්ධනය කිරීම.
2. පුද්ගල හා ස්ථාන නාම කියවීම පිණිස කියවීමේ කුසලතා වර්ධනය කිරීම.
3. නම් හා ලිපින ලිවීමට හැකිවනු පිණිස ලිවීමේ කුසලතා වර්ධනය කිරීම.

## භාෂා පාඨමාලා උපදේශකවරුන් සඳහා ගෙවීම්

- පැය 50 පාඨමාලාව සඳහා 01 පැයකට අනුමත ගෙවීම රු. 400/=

| ඒකකය | අරමුණ | අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රමවේදය | කාලය පැය | කාලය බෙදන ආකාරය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ශ්‍රවණය, කථනය හා කියවීම | ලිවීම |
| 01 | 1.1 භාෂාව ඉගෙනීම පහසු බව අවබෝධ කරමින් රුචිය ඇති කරයි<br><br>1.2 තමා පිළිබඳ විස්තර කිරීම | • සිංහල දෙමළ සමරූපී වචන හඳුන්වා දීම<br>අම්මා අක්කා<br>ආච්චි මුදලාලි<br><br>• නම, ගම, වයස | • සිංහල වචන හඳුනා ගෙන කියයි<br><br>• තමා පිළිබඳ විස්තර කියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය | 02 | 02 | - |
| 02 | 2.1 වාචික ප්‍රකාශන උචිත පරිදි යොදා ගනිමින් කථනයේ යෙදෙයි. | • සුබ පැතීම්<br><br>• ස්තුති කිරීම් | • සුභපැතුම් සඳහා භාවිත වන යෙදුම් කියයි.<br><br>• ස්තුතියි යන වචනය අවස්ථාවෝචිතව ප්‍රකාශ කරයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය | 02 | 02 | - |
| 03 | 3.1 නියමිත හැඩතල හඳුනාගනිමින් අකුරු ලිවීම<br><br>3.2 වචන හඳුනාගැනීම | • අකුරු ලිවීම.<br>ට ව ච ධ ඩ<br>බ ම ඹ ර ග භ හ<br>• මෙම අකුරු යොදා අර්ථවත් වචන කිහිපයක් සකස් කිරීම<br>රට, ගහ , බර, වම, වධ | • අකුරු නිවැරදි ව ලියයි.<br><br>• වචන නිවැරදි ව ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්වීභාෂා ක්‍රමය | 02 | - | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 04 | 4.1 පුද්ගල හා ස්ථාන නාම හඳුනාගෙන කථනයේ යෙදෙයි. | • පවුලේ ඥාතීන් හඳුන්වන නම්<br>අම්මා තාත්තා<br>ආච්චී සීයා<br><br>• විවිධ ස්ථාන හඳුන්වන නම්<br>පාසල කාර්යාලය<br>රෝහල | • පුද්ගල හා ස්ථාන නාම හඳුනාගෙන කියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය | 02 | 02 | - |
| 05 | 5.1 නියමිත හැඩතල හඳුනාගනිමින් අකුරු ලිවීම<br><br>5.2 වචන හඳුනාගැනීම | • අකුරු ලිවීම.<br>අ ආ ඇ ඈ ඉ ඊ<br>ද ඳ ල ළ ෆ ණ<br><br>• මෙම අකුරු යොදා අර්ථවත් වචන කිහිපයක් සකස් කිරීම<br>අඳ , අල, ඇණ, ඇඳ | • අකුරු නිවැරදි ව ලියයි.<br><br>• කුඩා වචන නිවැරදි ව ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්වීභාෂා ක්‍රමය | 02 | - | 02 |
| 06 | 6.1 නිවැරදි කථනය සඳහා සම්බන්ධාර්ථවාචී නාමවචන භාවිත කරයි. | • 'ගේ'ප්‍රත්‍යය භාවිත කරමින් පවුලේ අය ගැන හැඳින්වීම<br>මගේ අම්මාගේ නම<br><br>• පන්තියේ මිතුරා ගැන හැඳින්වීම | • 'ගේ ප්‍රත්‍ය සහිත නාම වචන යෙදුණු වාක්‍ය කියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 02 | 02 | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 07 | 7.1 නියමිත හැඩතල හඳුනාගනිමින් අකුරු ලිවීම<br><br>7.2 වචන හඳුනාගැනීම | • අකුරු ලිවීම.<br>ස ප ජ ත ක න<br>උ ඌ එ ඒ ඔ ඕ<br>• මෙම අකුරු යොදා අර්ථවත් වචන කිහිපයක් සකස් කිරීම<br>කන ඒක, එතන ඌ, ඕන, එන | • අකුරු නිවැරදි ව ලියයි.<br><br>• කුඩා වචන නිවැරදි ව ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්වීභාෂා ක්‍රමය | 02 | - | 02 |
| 08 | 8.1 පිල්ලම් භාවිතය පිළිබඳ දැනුම | • පිල්ලම් ලිවීම<br>• සම්පූර්ණ සිංහල හෝඩිය ලිවීම | • අකුරු නිවැරදි ව ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්වීභාෂා ක්‍රමය | 04 | - | 04 |
| 09 | 9.1 විවිධ ඉල්ලීම් හා උපදෙස්වලට සවන් දී ප්‍රතිචාර දක්වයි | • ඉල්ලීම්<br>• විධාන ක්‍රියා | • විධාන ක්‍රියා සහිත කෙටි වාක්‍ය කියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරකම් | 02 | 02 | - |
| 10 | 10.1 ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද හඳුනා ගැනීම | • එළවළු, පලතුරුවල නම් කියවීම<br>• සතුන්ගේ , කුරුල්ලන්ගේ නම් කියවීම | • ප්‍රාණවාචී හා අප්‍රාණ වාචී නාම පද හඳුනාගෙන කියයි | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරකම් | 02 | 02 | - |
| 11 | 11.1 නාමපදයක ප්‍රාණවාචී අප්‍රාණවාචී භේදය හඳුනාගෙන ක්‍රියා පද නිවැරදිව භාවිත කරයි. | • ඉන්නවා, තියෙනවා<br>බල්ලා ඉන්නවා<br>කැරට් තියෙනවා | • ඉන්නවා, තියෙනවා යන පද නිවැරදි ව යොදා වාක්‍ය කියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරකම් | 02 | 02 | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 12 | 12.1 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් ද්‍රව්‍ය හා පුද්ගලයින් පිළිබඳ විමසයි. | • ප්‍රශ්නඇසීම<br>කවුද ?<br>මොකක් ද<br>මොනවා ද? | • කවුද යන පදය භාවිත කරමින් ප්‍රශ්න අසයි.<br>• මොකක් ද යන පදය භාවිත කරමින් ප්‍රශ්න අසයි.<br>• මොනවාද යන පදය භාවිත කරමින් ප්‍රශ්න අසයි.<br>• ප්‍රශ්න සඳහා පිළිතුරු දෙයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 02 | 02 | - |
| 13 | 13.1 කතාබහේ දී සංඛ්‍යා නාම උචිත පරිදි භාවිත කරයි. | • සංඛ්‍යා 1-10,000<br>• වෙලාව කීම | • 1 සිට 10,000 දක්වා නිවැරදි ව ගණන් කරයි.<br>• වෙලාව නිවැරදි ව කියයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 04 | 04 | - |
| 14 | 14.1 ප්‍රශ්නවාචී පද උචිත පරිදි භාවිත කරමින් කතා කරයි. | • ප්‍රශ්නඇසීම<br>ඔව් නැත උත්තර අපේක්ෂිත ප්‍රශ්න<br>කීයට ද?<br>කොහේ ද?<br>මොකක්ද?<br>කීයද?<br>කොහොම ද? | • ප්‍රශ්නවාචී පද යොදා ගනිමින් අන්‍යයන්ගෙන් තොරතුරු විමසයි.<br>• තමා සහ අන්‍යයන් ගැන තොරතුරු පවසයි.<br>• කෘදන්ත පද රටාව අනුගමනය කරමින් වාක්‍ය කියයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 02 | 02 | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 15 | 15.1 කතාබහේ දී කාලවාචී නිපාත පද භාවිත කරයි. | • ප්‍රශ්නඇසීම<br>ද?<br>කීයද?<br>මොනවද? | • කාලවාචී නිපාත පද සහිත වාක්‍ය කියයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරකම් | 02 | 02 | | - |
| 16 | 16.1 ක්‍රියා පදවලින් සකස් කර ගන්නා පද රටා කතාබහ සඳහා භාවිත කරයි. | • පදරටා<br>යනවා-යන්නෙ | • පද රටා අනුව කුඩා වාක්‍ය කියයි | ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 02 | 02 | | - |
| 17 | 17.1 අර්ධ ක්‍රියා පද කතාබහේ දී නිවැරදි ව යොදා ගනියි. | • අර්ධ ක්‍රියා<br>ඕන, එපා, බෑ, පුළුවන් | • අදහස් ප්‍රකාශනයේ දී ඕන එපා බෑ පුළුවන් යන පද අවස්ථාවෝචිත ව භාවිත කරයි. | ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරකම් | 02 | 02 | | - |
| 18 | 18.1 එදිනෙදා කටයුතු හා බැඳුණු කතාබහේ යෙදෙයි. | • සතියේ දිනවල නම්,<br><br>• මාසවල නම්<br><br>• අද,හෙට,අනිද්දා, | • සතියේ දිනවල නම් කියයි<br><br>• මාසවල නම් කියයි<br><br>• කාලවාචී නිපාත පද සහිත වාක්‍ය කියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරකම් | 02 | 02 | | - |
| 19 | 19.1 කතාබහේ දී සර්වනාම පද උචිත පරිදි භාවිත කරයි. | • සර්ව නාම<br>එතන, මෙතන,<br>අතන,ඔතන<br>ඒවා , මේවා, අර, අරක | • සර්වනාම යෙදුණු වාක්‍ය කියයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 02 | 02 | | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 20 | 20.1 උචිත පද භාවිත කරමින් මග සලකුණු කියයි. | • පාර කීම<br>දකුණට, වමට,<br>ඉස්සරහට, පස්සට | • නිවැරදි ව මග සලකුණු කියයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 02 | 02 | - |
| 21 | 21.1 එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කෙටි ලිඛිත ප්‍රකාශන සවන් දී අවබෝධ කර ගනියි.කියවයි | • දැන්වීම්,<br>• උපදෙස් කියවීම.<br>• පුවත්පත් නාම<br>• තනතුරු නාම කියවීම,<br>• නාමපුවරු කියවීම<br>• ලිපිනය කියවීම, | • දැන්වීම් කියවයි.<br>• උපදෙස් කියවයි.<br>• පුවත්පත්වල නම් කියවයි.<br>• තනතුරු නාම නිවැරදි ව කියවයි.<br>• නාම පුවරු නිවැරදි ව කියවයි.<br>• ලිපිනයක් නිවැරදි ව කියවයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරකම් | 06 | 06 | - |